**ශීර්ෂය 404 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 05 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයය.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රු. 295,906 ක් වූ අත්තිකාරම් ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන්කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂය සටහන් කිරීමට කටයුතු කරන බව. | වර්ෂය අවසානයේ අත්තිකාරම් ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කල යුතුවීම. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැදීම් හා බැරකම් ලේඛනය පවත්වා නොතිබුණි. | මෙම කාලසීමාව තුළ බැදීම් ඇති කර ගත යුතු ආකාරයේ ක්‍රියාකාරකම් සිදු නොවූ බැවින් බැදීම් හා බැරකම් ලේඛනයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවයක් නොවූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැදීම් හා බැරකම් ලේඛනයක් පවත්වා ගත යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වැය විෂයන් 12 කට අදාළව වෙන්කළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.6,171,757 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | කාර්යමණ්ඩලය, වාහන, කාර්යාල පහසුකම් ආදී අවශ්‍යතා අවම මට්ටමින් භාවිත කරමින් රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු පවත්වා ගෙන යාමත් covid – 19 තත්ත්වය මත පුහුණු පාඨමාලා ඇතුළු කාර්යයන් ක්‍රියාත්මක කළ නොහැකි වීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වූ බව. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට වාර්ෂිකව සලසනු ලබන ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කරන ලද ප්‍රතිපාදන වලින් අවස්ථා 05 කදී එකතුව රු. 3,599,760 ක් වූ ප්‍රතිපාදනයන් ඉතුරුව පැවති අතර එය සියයට 30 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | කාර්යමණ්ඩලය, වාහන, කාර්යාල පහසුකම් ආදී අවශ්‍යතා අවම මට්ටමින් භාවිත කරමින් රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු පවත්වා ගෙන යාමත් covid – 19 තත්ත්වය මත පුහුණු පාඨමාලා ඇතුළු කාර්යයන් ක්‍රියාත්මක කළ නොහැකි වීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වූ බව. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට වාර්ෂිකව සලසනු ලබන ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

## 2. 2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය වෙනුවෙන් එකතුව රු. 87,909 ක් වූ බැරකම් 04 ක් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් කර නොතිබුණි. | අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන අවස්ථාවේදී මෙම බැරකම් පිළිබඳව දැනුවත් වී නොතිබූ බව. | ගිණුම් වර්ෂයට අදාළ බැරකම්,බැරකම් ලේඛනයේ ඇතුළත් කිරීමටෙ කටයුතු කළ යුතුවීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 (6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම වාර්තා 2021 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2021 ජූලි 31 දින වන විටත් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මු.රෙ. ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදුකිරිමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතුවීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂයේ අදාළ ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | අළුතින් පිහිටුවන ලද මෙම අමාත්‍යාංශයට නිත්‍ය කාර්යය මණ්ඩලයක් නොසිටීම හා නිශ්චිත කාර්යාල පරිශ්‍රයක් නොතිබීම හේතුවෙන් 2020 වර්ෂයේ අදාළ කාලපරිච්ඡේදයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීමට අවකාශ නොලැබුණු බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවීම. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | පිළියෙළ කර ඇත. | චක්‍රලේඛනයේ දක්වා ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුවීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව රාජ්‍ය අමාත්‍යංශය විසින් දැනුවත් වී, රාජ්‍ය අමාත්‍යංශය අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනා ගෙන නොතිබුණි. | ජාතික අධ්‍යාපන ආයතන විෂය මාලා සංශෝධන හා විදුහල්පතිවරුන් හා ගුරුවරුන් පුහුණු කිරීම මත සියළු කටයුතු ආරම්භ කරමින් ක්‍රියාත්මක කරමින් යන බව. | අමාත්‍යංශයට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනා ගත යුතුවීම. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර අභ්‍යන්තර විගණක ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |